# සුවෙන් පෙරට
# e ඉගෙනුම් පියස
# මිනුවන්ගොඩ

- ශ්‍රේණිය - 6
- විෂයය - ඉතිහාසය
- පාඩම - 05 - අපේ අතීත රජවරු


- සැකසුම - තමාලි පෙරේරා
  නියෝජ්‍ය විදුහල්පති
  මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය

# වළගම්බා රජතුමා



## ➢ වළගම්බා රජු කවුරුන්ද ?

දුටුගැමුණු රජුගේ සොයුරු සද්ධාතිස්ස රජුට පුතුන් සතර දෙනෙකි

1. ලජ්ජිතිස්ස
2. ථුලත්ථන
3. බල්ලාටනාග
4. වළගම්බා




❖ එසේනම් වළගම්බා යනු සද්ධාතිස්ස රජුගේ බාලම පුත්‍රයාය

# වළගම්බා රජුට මුහුණ දීමට සිදු වූ අභියෝග



- තිස්ස බ්‍රාහ්මණයාගේ කැරැල්ල
- සප්ත ද්‍රවිඩ ආක්‍රමණය
- බැමිණිතියාසාය




❖ සප්ත ද්‍රවිඩ ආක්‍රමණය හමුවේ වළගම්බා රජුට පලායාමට සිදුවිය .

❖ එහිදී රජ බිසව වූ සෝමා දේවිය රථයෙන් බැස්සාය.

❖ ඒ රජුට ආක්‍රමණිකයන්ගෙන් බේරී ඉක්මනින් පලා යාම සඳහාය.




- වළගම්බා රජතුමා වසර 14ක කාලයක් වනගතව වාසය කළේය
- මෙකල රහසේම සේනා සංවිධානය කළේය
- එහිදී රජුට උපකාර කළේ කුපික්කලතිස්ස නම් හිමියන්ය
- අවසාන ද්‍රවිඩ ආක්‍රමණිකයා වූ දාඨික පරාජය කළ රජතුමා නැවත රාජ්‍යත්වයට පත් විය



# ❖ අභයගිරි විහාරය


වළගම්බා රජතුමා වනගත වී සිටි කාලයේ දී උදව් කළ කුපික්කලතිස්ස හිමියන්ට කළගුණ සැලකීම සඳහා අභයගිරි විහාරය තනවා ඒ හිමියන්ට පූජා කළේය.



# අභයගිරි විහාරය පසුව අන්තර්ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත් විය.





## ➢ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

- බැමිණිතියාසාය නිසා ධර්මය කටපාඩමින් රැගෙන ආ භික්ෂූන් පිරිසක්ද අපවත් වූහ .
- එහිදී රජතුමා මාතලේ අලුවිහාරයට භික්ෂූන් රැස් කරවා
  ධර්මය පුස්කොලවල ලියා ග්‍රන්ථගත කිරීමට කටයුතු කළේය.





## ❖ සෙල්ලිපිවල වළගම්බා රජු හඳුන්වා ඇත්තේ

- පිත රජ
- පිතු රාජ
- පිත මහ රජ යන නම්වලිනි .




## ❖ සෝමා දේවිය

- සෝමා දේවිය මහත් පින් ඇති වීර කාන්තාවකි .
- සතුරන් පරාජය කළ රජතුමා සෝමා දේවිය නැවත ගෙන්වා ගෙන අගබිසෝ තනතුරට පත් කළේය
- ඇය සතුරන් ඉදිරියට ගිය තැන සිහිවීම පිණිස එතැන සෝමාරාමය ඉදිකරවා එය භික්ෂූන් වහන්සේලාට පූජා කළේය



## ❖ වළගම්බා රජුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ

- ✓ අභියෝග ජය ගැනීම
- ✓ ඉවසිලිවන්ත බව
- ✓ බුද්ධිමත් බව
- ✓ දුරදක්නා නුවණ



## ❑ ක්‍රියාකාරකම

1.වළගම්බා රජුගේ පියා, සොහොයුරන් හා බිසව නම් කරන්න.
2.රජුට මුහුණ දීමට සිදු වූ අභියෝග තුනක් ලියන්න.
3.කරදරවල පැටලී සිටි අවස්ථාවේදී රජුට උපකාර කළ ස්වාමීන් වහන්සේ නම් කරන්න.
4.ඒ හිමියන්ට කළගුණ සැලකීම සඳහා රජ විසින් තනවා පූජා කරන ලද විහාරය කුමක්ද ?
5.වළගම්බා රජුගේ අනුග්‍රහයෙන් සිදු වූ ධර්මය පොත්වල ලියවීම හඳුන්වන්නේ කෙසේද ?
6.එම කාර්යය සිදු කරන ලද්දේ කුමන ස්ථානයේදීද ?
7.මෙම රජු හැඳින්වීමට සෙල්ලිපිවල යොදා ඇති නම් මොනවාද ?
8.එම නම්වලින් රජු හැඳින්වීමට හේතුව කුමක්ද ?
9.වළගම්බා රජුගේ බිසව වූ සෝමා දේවිය පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න .
10.සෝමා දේවිය සතුරන් ඉදිරියට ගිය තැන සිහිවීම පිණිස රජු ඉදිකළ විහාරය කුමක්ද ?
11.රජුගේ චරිතයෙන් ඔබට ගතහැකි ආදර්ශ නම් කරන්න .



ස්තූතියි!

තමාලි පෙරේරා